**ශ්‍රී ලංකාවේ ගංවතුර සහ නායයෑම් ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ දෙවන ව්‍යාපෘතිය - 2017**

---

ශ්‍රී ලංකාවේ ගංවතුර සහ නායයෑම් ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ දෙවන ව්‍යාපෘතියේ 2017 ජුනි 09 සිට 2018 මාර්තු 09 දිනෙන් අවසන්වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 ජුනි 09 දින එළඹි අංක 0533 දරන ප්‍රදාන ගිවිසුමේ උප ලේඛනයේ IV 4.01 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, එවකට නිවාස කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ අභ්‍යන්තර හා නිවාස කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර බස්නාහිර දකුණු සහ සබරගමුව පළාත්වල දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 ක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ 2017 මැයි මාසයේදී ගංවතුර සහ නායයෑම් ආපදාවලින් විපතටපත් ජනතාව සඳහා ජීවිත ආරක්ෂා කිරීමේ සේවාවන් සැපයීම වේ. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 02 කට සමාන රු.මිලියන 307.46 ක් වූ අතර ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2017 ජුනි 9 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 9 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව 2018 මාර්තු 09 දින දක්වා ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදු පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඌ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 2.1 මතය

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2018 මාර්තු 09 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සහතික කිරීම සඳහා ඉදිරිපත්කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව

(ඇ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදෙන ලද කරුණු නිවැරදිකර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
---------------------------------------

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

බස්නාහිර, දකුණු සහ සබරගමු පළාත්වල දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 ක් විසින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර තිබුණු අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අරමුදල් ප්‍රතිපාදනයෙන් රු. මිලියන 287.98 ක ප්‍රමාණයක් සෘජුවම අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට මාරුකර තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ සමාලෝචිත කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන අභ්‍යන්තර, නිවාස කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් එකතුකර ගන්නා තොරතුරු වලින් සිහිවටන පදනම මත පිළියෙල කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**
**---------------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**
**-----------------------**

ව්‍යාපෘතියේ මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අරමුදල් උපයෝජනය සහ 2018 මාර්තු 09 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ප්‍රදාන ගිවිසුම අනුව මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල** | | **සමාලෝචිත කාල පරිච්ඡේදය වූ 2018 මාර්තු 09 දිනට අරමුදල් උපයෝජනය** | |
|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආ.සං.බැ | 2.00 | 307.46 | 1.87 | 287.98 |
| | <u>2.00</u> | <u>307.46</u> | <u>1.87</u> | <u>287.98</u> |

රු. මිලියන 19.477 කට සමාන එජඩො 126,698 ක ශේෂයක් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු අවසන්වූ 2018 මාර්තු 09 දිනට වැය නොකර රඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ලැබුණු තොරතුරුවලට අනුව එජඩො 111,212 ක ශේෂයක් පමණක් ණය සපයන ලද නියෝජිතායතනයට 2018 නොවැම්බර් 08 දින ආපසු ගෙවා තිබුණි.

3.2 භෞතික කාර්ය සාධනය

---------------------------

ලැබුණු තොරතුරුවලට අනුව ව්‍යාපෘතියේ කටයුතු ප්‍රධාන ක්‍රියාකාරකම් 10 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඒ යටතේ හදිසි බේරාගැනීමේ උපකරණ, වෛද්‍ය උපකරණ, ජලය පිරිපහදු කිරීමට සහ සනීපාරක්ෂක පද්ධති, තාවකාලික කූඩාරම් සනීපාරක්ෂක කට්ටල, සහ හදිසි සන්නිවේදන උපකරණ මිළදී ගැනීම් සහ සුන්බුන් ඉවත් කිරීම, වැඩබිම පිරිසිදු කිරීම, කුඩා ගල් කැබලි ඉවත් කිරීම සහ අනෙකුත් ක්‍රියාකාරකම් 2018 මාර්තු 09 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සම්පූර්ණකර තිබුණි. කෙසේවුවද ව්‍යාපෘතිය නිමකිරීමේ වාර්තාව පිළියෙළකර ඉදිරිපත් කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

ව්‍යාපෘතිය කලුතර, ගාල්ල. රත්නපුර, මාතර හා කෑගල්ල දිස්ත්‍රික්කවල රැඳවුම් කඳවුරු 17 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර ඒ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 11.55 කට පිරිනමා තිබුණු රත්නපුර දිස්ත්‍රික්කයේ රැඳවුම් කඳවුරු ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ 2017 නොවැම්බර් 25 දින නිමකිරීමට එකඟ වී තිබුණ ද, දින 102 ක ප්‍රමාදයක් සහිතව 2018 මාර්තු 07 දින නිමකර තිබුණි.

(ආ) කළුතර දිස්ත්‍රික්කයේ පාලින්ද නුවර රැඳවුම් කඳවුරුවල ඉදිකරන ලද පානීය ජල ලිඳවල්වල ජලයේ ගුණත්වය පානීය කාර්යයන් සඳහා සුදුසු නොවීම නිසා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පැවතුණු බව 2018 දෙසැම්බර් 21 දින කළ වැඩබිම් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවදුරටත් රු.මිලියන 2.95 ක වියදමින් කෑගල්ල දිස්ත්‍රික්කයේ වෙල්ලන්ගල ප්‍රාථමික විද්‍යාලයේ ඉදිකරන ලද රැඳවුම් කඳවුරු සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් හා ජල පහසුදම් නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ණය සපයන නියෝජිතායතනය විසින් නිකුත්කරන ලද උපදෙස් වලට අනුව ඉදිකළ රැඳවුම් කඳවුරු අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට භාරදීම කළයුතු විය. කෑගල්ල, රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කවල රු.මිලියන 23.28 ක වියදමින් ඉදිකරන ලද තාවකාලික මධ්‍යස්ථාන 3 ක් 2018 දෙසැම්බර් 31 වන විටත් අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත භාරදී නොතිබුණි. රත්නපුර දිස්ත්‍රික්කයේ කරන්ගොඩ විහාරස්ථානයේ ඉදිකර තිබූ රැඳවුම් කඳවුරු හැර හදිසි අවස්ථාවලදී තාවකාලික කූඩාරම් ප්‍රයෝජනයට ගන්නා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් ඇතුළුව අවතැන්වූ පුද්ගලයින් සඳහා ප්‍රමාණවත් පහසුකම් සපයා නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

3.4 නිෂ්ක්‍රීය වත්කම්

-------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෑගල්ල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට බෙදාහැරීමට රු. මිලියන 5ක වියදමින් විදුලි ජනක යන්ත්‍ර 111 ක් ප්‍රසම්පාදනය කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට ඉන් විදුලි ජනක යන්ත්‍ර 91 ක් පමණක් බෙදාහැර තිබූ බව නිරීක්ෂණය විය. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ගබඩාවේ සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී විදුලි ජනක යන්ත්‍ර 16ක් පමණක් භෞතික සත්‍යාපනය සඳහා ඉදිරිපත් කර තිබුණු බව අනාවරණය විය. යන්ත්‍රවල නිතිපතා නඩත්තු සේවා කිරීමට කටයුතු කර නොතිබූ අතර එම යන්ත්‍රවල හොඳින් වැඩ කිරීමේ තත්ත්වය මැනීමට පරීක්ෂණ සිදුකර නොතිබුණ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතිය විසින් සමාලෝචිත කාල පරිච්ඡේදය තුල කෑගල්ල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 11 කට බෙදා හැරීමට ප්‍රසම්පාදනය කරන ලද ජීවිතාරක්ෂන තබා 73 කින් ජීවිතාරක්ෂන තබා 23 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාල 4 කට බෙදාහැර තිබුණි. ඉතිරි ජීවිතාරක්ෂක තබා කෑගල්ල ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ගබඩාවල භාවිතයට පැවතුණි. රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නඩත්තු කරන ලද වාර්තාවලට අනුව තවදුරටත් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ කොලොන්න සහ බලංගොඩ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලට ලාම්පු 34 නිකුත්කර තිබුණි. කෙසේ වුවද අදාල කාර්යාල විසින් නඩත්තු කරන ලද වාර්තාවලට අනුව බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලාම්පු ලැබී නොතිබුණු අතර කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලාම්පු 8 ක් පමණක් ලැබී තිබුණි.

3.5 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 ජූලි 26 දිනැති අංක 5 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයට හා මුදල් රෙගුලාසි 133 හි අවශ්‍යතා පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර සහ නිවාස කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට ලක්වී නොතිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශය යටතේ වූ රු.මිලියන 2ක් වූ පරිපූරක ප්‍රතිපාදන සමාලෝචිත කාලපරිච්ඡේදයේ ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ කාර්ය මණ්ඩලයට ගෙවන ලද එකතුව රු.781,254 ක දීමනා අදාල අමාත්‍යාංශයේ වියදම් ලෙස සළකා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ වියදම් මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් පෙන්වා තිබුණි.